# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1794/2 – 2013 ජනවාරි 21 වැනි සඳුදා – 2013.01.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2013 අංක 05 දරන ආඥාව**

මගේ යොමු අංකය: එල්ඩී/05/2010/සීර්බී/17.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: අඹකෝ/3/1/අ/140-iii.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2012 දෙසැම්බර් මස 19 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.–** ප්‍රාදේශීය ලේකම්, අඹගමුව කෝරළේ.

2. **ඉඩමේ විස්තරය.–** මධ්‍යම පළාතේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ අඹගමුව කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අඹගමුව කෝරළේ සුළු කොට්ඨාසයේ පිටවල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක NU/ABM/2010/141 හා 2010.10.13 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර ඒ සහ බී වශයෙන් දක්වා ඇති ප්‍රමාණයෙන් හෙක්. 8.7043 වූ ඉඩම් කොටස් 02 (දෙක) ට මායිම්.

01. **කැබලි අක්ෂර 'ඒ' – බ්‍රෝඩ්ලන්ඩ් වත්ත – ප්‍රමාණය: හෙක්. 3.7757**
උතුරට: රඹුක්පත් ඔය සහ මාර්ගය (මා.සං.අ.); නැගෙනහිරට: මාර්ගය (මා.සං.අ.) සහ දෙල්පත් ඔය; දකුණට: දෙල්පත් ඔය සහ කැළණි ගඟ; බටහිරට: කැලණි ගඟ සහ රඹුක්පත් ඔය.

02. **කැබලි අක්ෂර 'බී' – බ්‍රෝඩ්ලන්ඩ් වත්ත – ප්‍රමාණය: හෙක්. 4.9286**
උතුරට: දෙල්පත් ඔය සහ මාර්ගය (මා.සං.අ.); නැගෙනහිරට: මාර්ගය (මා.සං.අ.), ඇල සහ කැබලි අංක 212; දකුණට: කැබලි අංක 212 සහ කැළණි ගඟ; බටහිරට: කැලණි ගඟ සහ දෙල්පත් ඔය.

02 - 201

1A – G 17175 – 370 (2013/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.